# වාර්ෂික වාර්තාව 2023

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්
ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය

# පටුන


**පිටු අංක**

| | |
|---|---|
| 01. හැඳින්වීම | 03 |
| 02. අධිකාරියේ දැක්ම සහ මෙහෙවර | 04 |
| 03. අධිකාරියේ අරමුණු සහ කාර්යයන් | 05-06 |
| 04. ආයතනයේ සංවිධාන ව්‍යුහය සහ කාර්යය මණ්ඩලය | 07-11 |
| 05. කාර්යය සාධනය | |
| 5.1 නීති හා නීති බලාත්මක කිරීමේ අංශය | 12-16 |
| 5.2 රැකවරණ අංශය | 17-18 |
| 5.3 ප්‍රතිපත්ති හා වැඩසටහන් අංශය | 19-32 |
| 5.4 පාලන හා කළමනාකරණ අංශය | 33-34 |
| 5.5 මූල්‍ය අංශය | 35 |
| 06. මූල්‍ය ප්‍රකාශනය හා විගණන වාර්තාව | 36-66 |
| 07. කාර්යසාධනය වර්ධනයට අදාල කෙටිකාලීන/අර්ධකාලීන සැලසුම් | 67-68 |

# 01.හැඳින්වීම

වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා විධිමත් නෛතික රාමුවක් සහ වැඩපිළිවෙළක් හඳුන්වා දීම මගින් අපරාධ යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය සවිබල ගැන්වීම සඳහා පාර්ලිමේන්තුව විසින් ඒකමතිකව සම්මත කරන ලද, 2015 අංක 04 දරන අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන්හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත යටතේ, අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය පිහිටුවා ඇත. මෙම අධිකාරිය පිහිටුවීමේ මූලික අරමුණ වී ඇත්තේ අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම් ප්‍රවර්ධනය, ආරක්ෂා කිරීම සහ බලාත්මක කිරීම වේ.ඊට අතිරේකව අපරාධ වින්දිතයන්හට සිදුවන කායික සහ මානසික හානි වෙනුවෙන් වන්දි ලබා දීම සඳහා අවශ්‍ය ආරක්ෂණ අරමුදල් පවත්වා ගැනීම සේම අපරාධ වින්දිතයන්ට හා සාක්ෂිකරුවන්ට අවශ්‍ය ආරක්ෂාව සැලසීම සහ වෙනත් සහනයන් ලබා දීම මෙන්ම අපරාධයක වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට එරෙහිව සිදුවන වැරදි විමර්ශනය කිරීම හා ඊට අදාල දණ්ඩන නියම කිරීමත් මෙම අධිකාරිය මඟින් ඉටු කරනු ලැබේ.

ඒ අනුව මහජනතාවගෙන් ලැබෙන පැමිණිලි විමර්ශනයන් සිදු කිරීමත්, අදාල පැමිණිලි අවශ්‍ය පරිදි කළමණාකරණ මණ්ඩලය විසින් පත් කරන මූල මණ්ඩලයකට යොමු කොට එකී මූල මණ්ඩලයේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම ද සිදුවේ.එසේම අපරාධ වින්දිතයන්ගේ හා සාක්ෂිකරුවන්ගේ ආරක්ෂාව සඳහා ලැබෙන ඉල්ලීම් අධිකාරියට සම්බන්ධ පොලිස් සහායක සහ ආරක්ෂක කොට්ඨාසයට යොමු කර තර්ජන තක්සේරු සිදු කිරීමෙන් අනතුරුව එකී තර්ජනයේ ස්වභාවය අනුව වින්දිතයාට හා සාක්ෂිකරුට ආරක්ෂාව ලබා දීම සිදු කෙරේ.එමෙන්ම අධිකරණ කටයුතුවලට සහභාගී වීමේ දී වින්දිතයන්ට හා සාක්ෂිකරුවන්ට ආරක්ෂාව සැලසීමද, ඊට අතිරේකව සමකාලීන ශ්‍රව්‍ය- දෘශ්‍ය තාක්ෂණය මගින් ආරක්ෂිත ස්ථානයන්හි සිට සාක්ෂි ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය ද මෙම අධිකාරිය විසින් සිදුකරනු ලැබේ.

අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා විධිමත් නෛතික රාමුවක් සහ වැඩපිළිවෙළක් හඳුන්වා දීම මගින් අපරාධ යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය සවිබල ගැන්වීම සඳහා පාර්ලිමේන්තුව විසින් ඒකමතිකව සම්මත කරන ලද 2015 අංක 04 දරන අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත යටතේ, අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය පිහිටුවා ඇත. මෙම අධිකාරිය කළමනාකරණ මණ්ඩලයක් විසින් පාලනය කරනු ලබන අතර වර්තමාන කාර්යය මණ්ඩලය 35කි. අපරාධයක වින්දිතයන්ගේ හිමිකම් සහ අයිතිවාසිකම් මෙන්ම සාක්ෂිකරුවන්ගේ හිමිකම් ආරක්ෂා කිරීම සහ සහාය දීම අධිකාරියේ මූලික කාර්යය භාරය වේ. මෙම 2015 අංක 04 දරන අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත යාවත්කාලීන කරමින් 2023 සැප්තැම්බර් මස 15 දින සිට ක්‍රියාත්මක වන පරිදි 2023 අංක 10 නව පනතක් ලෙස අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ ප්‍රමුඛතාවය ඇතිව පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබූ නව පනත බලාත්මක කර ඇත.

# 02.අධිකාරියේ දැක්ම - මෙහෙවර

- ✓ <u>දැක්ම</u>

**අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් සුරකින ශ්‍රී ලංකාවක්**

- ✓ <u>මෙහෙවර</u>

**අපරාධයක වින්දිතයන්ගේ හා සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් හා හිමිකම් සුරක්ෂිත කිරීම හා ප්‍රවර්ධනය කිරීම, බලාත්මක කිරීම හා ක්‍රියාත්මක කිරීම**

# 03.අධිකාරියේ අරමුණු සහ කාර්යයන්

## 3.1 අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ අරමුණු

1. අපරාධ වින්දිතයන්ගේ අයිතිවාසිකම් හා හිමිකම් හඳුනා ගැනීම, ප්‍රවර්ධනය කිරීම හා අදාල පැමිණිලි විමර්ශනය කොට එකී නිර්දේශ ක්‍රියාත්මක කිරීම.
2. සාක්ෂිකරුවන්ගේ හිමිකම් හඳුනා ගැනීම හා අදාල පැමිණිලි විමර්ශනය කොට එකී නිර්දේශ ක්‍රියාත්මක කිරීම.
3. අපරාධ වින්දිතයන් හා සාක්ෂිකරුවන්ට අවශ්‍ය සහායයන් සැපයීම හා ආරක්ෂාව ලබාදීමට කටයුතු කිරීම.
4. අපරාධ වින්දිතයන්ගේ හා සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් හා හිමිකම් සම්බන්ධයෙන් රාජ්‍ය නිලධාරීන් සංවේදීකරණය කිරීම.
5. අපරාධ වින්දිතයන් හා සාක්ෂිකරුවන්ට එරෙහිව සිදුවන වැරදි සම්බන්ධව නීති මගින් කටයුතු කිරීම.
6. අපරාධ වින්දිතයන් හා සාක්ෂිකරුවන් සඳහා වන්දි ලබාදීමේ අරමුදල පවත්වාගෙන යාම සහ යෙදවීම.
7. අපරාධ අඩු කිරීම හා ඒ සඳහා පර්යේෂණ පැවැත්වීම.
8. අපරාධ සම්බන්ධ දඬුවම් නියම කිරීම සඳහා විකල්පයක් වශයෙන් වින්දිතයන් පුනරුත්ථාපනය කිරීමට අවශ්‍ය පියවර වර්ධනය කිරීම හා ඒ සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම.

## 3.2 අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ කාර්යය සහ කර්තව්‍යන්

1. අපරාධයක වින්දිතයන්ගේ අයිතිවාසිකම්, හිමිකම් හඳුනා ගැනීම, ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීම.
2. සාක්ෂිකරුවන්ගේ හිමිකම් හඳුනා ගැනීම, ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය කිරීම.
3. අපරාධයක වින්දිතයන්ගේ හෝ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් හෝ හිමිකම් කඩවීම සම්බන්ධ ලැබෙන පැමිණිලි විභාග කොට ඊට අදාළ නීතිමය ක්‍රියාමාර්ග ගැනීම.
4. අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්ට අවශ්‍ය ප්‍රතිකාර, හානිපූරණය, ප්‍රතිෂ්ඨාපනය සහ පුනුරුත්ථාපනය සඳහා අවශ්‍ය පියවර ගැනීම.
5. අපරාධයක වින්දිතයන්ට හා සාක්ෂිකරුවන්ට වන්දි ප්‍රදානය කිරීම.
6. මෙම පනත මගින් දක්වා ඇති අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් හා හිමිකම් පිළිබඳ මහජනතාව දැනුවත් කිරීම.
7. අපරාධයක වින්දිතයන්ට හා සාක්ෂිකරුවන්ට ආරක්ෂාව සැපයීම , අවශ්‍ය ප්‍රතිකාර, පුනුරුත්ථාපන හා උපදේශනය ඇතුලු සහායන් සැපයීම සඳහා සියලුදෙනා දැනුවත් කිරීම.
8. අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් හා හිමිකම් පුනුරුත්ථාපනය කිරීමට අදාළව අනෙකුත් ආයතනවල ප්‍රතිපත්ති හා අනෙකුත් පටිපාටින් සංශෝධන සඳහා නිර්දේශ ලබාදීම.
9. සෑම අධිකාරියකින් හෝ කොමිෂන් සභාවකින් හෝ යම් තැනැත්තකුගේ ඉල්ලීම මත සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධිකරණ පද්ධතිය ඔස්සේ සාක්ෂි ලබාගැනීමේ නිදහස හා සහාය සැපයීම පිළිබඳ තොරතුරු ලබාදීම.
10. යම් අධිකරණයකින් හෝ කොමිෂන් සභාවකින් හෝ වෙනයම් තැනැත්තකුගේ ඉල්ලීම මත සමකාලීන ශ්‍රව්‍ය- දෘශ්‍ය මාධ්‍ය ඔස්සේ සාක්ෂි ලබා ගැනීම සඳහා පිළිගත් ප්‍රතිමානවලට අනුකූලව පහසුකම් සැපයීම.
11. අපරාධයක වින්දිතයන්ට හා සාක්ෂිකරුවන්ට වයස, ස්ත්‍රී පුරුෂභාවය, අබාධිතබව හෝ වෙනත් විශේෂ අවශ්‍යතාවය මත සිදු විය හැකි හානි පිළිබඳ රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම සහ අපරාධ සිදුවීම අඩු කළ හැකි ක්‍රම සහ ඒ සම්බන්ධ පරීක්ෂණ පැවැත්වීම.
12. දඬුවම් නියම කිරීමට විකල්පයක් වශයෙන් අපරාධ වින්දිතයන් පෙර සිටි තත්ත්වයට ගැනීමේ පියවර වර්ධනය කිරීම හා ඊට අදාල නිර්දේශ ඉදිරිපත් කිරීම.
13. අපරාධ වින්දිතයන් හා සාක්ෂිකරුවන්ට සහාය සැපයීම සඳහා යෝජනා ක්‍රමයන් වැඩි දියුණු කිරීම, යොදා ගැනීම හා ක්‍රියාත්මක කිරීම.
14. අපරාධ වින්දිතයන් හා සාක්ෂිකරුවන්ගේ සහායක කොට්ඨාසය පවත්වාගෙන යාම හා නියමු උපදේශ නිකුත් කිරීම

# 04.ආයතනයේ සංවිධාන ව්‍යුහය සහ කාර්යය මණ්ඩලය

## 4.1 අධිකාරියෙහි කළමනාකරණ මණ්ඩලය

**පනත ප්‍රකාරව ජනාධිපතිවරයා විසින් පත් කළ සාමාජිකයින් :-**



- සභාපති : - ජනාධිපති නීතිඥ සුහද කේ.ගමලත් මහතා
  විශ්‍රාමික සොලිසිටර් ජනරාල්
  නීතිපති දෙපාර්තමේන්තුව



- වෛද්‍ය අජිත් තෙන්නකෝන් මහතා
  ප්‍රධාන අධිකරණ වෛද්‍ය නිලධාරී
- විශේෂඥ වෛද්‍ය වී. පී. ගමගේ මහතා
- නීතිඥ විමල් කුමාර මහතා
- නීතිඥ රුවිරා ගුණසේකර මෙනවිය

**නිල බලයෙන් පත්වූ සාමාජිකයින්: -**



1. ජනාධිපති නීතිඥ සුසන්ත බාලපටබැදි මහතා
   අතිරේක සොලිසිටර් ජනරාල්
   නීතිපති දෙපාර්තමේන්තුව
2. කමල් සිල්වා මහතා
   ප්‍රියන්ත වීරසූරිය මහතා
   ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති
   අපරාධ හා රථවාහන පාලන
   පොලිස් මූලස්ථානය



3. නිමල් කරුණාසිරි මහතා

කොමසාරිස්

මානව හිමිකම් කොමිෂන් සභාව



4. නීතිඥ පියුමන්ති පීරිස් මහත්මිය

අතිරේක ලේකම් (නීති)

අධිකරණ අමාත්‍යාංශය



5. එන්. එච්. එම්. ඩබ්ලිව්. එන්. හේරත් කුමාරි මහත්මිය

අතිරේක ලේකම් (සංවර්ධන)

කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය



6. එම්. එස්. පී. සූරියප්පෙරුම මහත්මිය

අතිරේක ලේකම් (නීතිය හා සාමය) (වැඩ බලන)

ආරක්ෂක අමාත්‍යාංශය



නිරීක්ෂක (භාණ්ඩාගාර නියෝජිත)

පී.එල්. ජේ. ගුණරත්න මහත්මිය[1], අධ්‍යක්ෂ (නීති කටයුතු)

කලමණාකරන විගනණ දෙපර්තුමෙන්තුව,

මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සම්පාදන අමාත්‍යාංශය

[1] 2023 මාර්තු මස සිට දෙසැම්බර් මස දක්වා

## 4.2 2023 වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු සාමාජිකයින්

1. නීතිඥ පියුමන්ති පීරිස් මහත්මිය - සභාපති

   අතිරේක ලේකම් (නීති), අධිකරණ අමාත්‍යාංශය

2. පී.එල්. ජේ. ගුණරත්න මහත්මිය[2], අධ්‍යක්ෂ (නීති කටයුතු)

   අධ්‍යක්ෂ ජනරාල්, කලමණාකරන විගණන දෙපාර්තුමේන්තුව, මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සම්පාදන අමාත්‍යාංශය

3. එම්. එස්. පී. සූරියප්පෙරුම මහත්මිය - සාමාජික
   අතිරේක ලේකම් (නීතිය හා සාමය) (වැඩ බලන),
   ආරක්ෂක අමාත්‍යාංශය
4. නීතිඥ විමල් කුමාර මහතා - සාමාජික
5. සුජීවා පෙරේරා මහත්මිය - නියෝජිත ජාතික විගණන කාර්යාලය
6. චම්පා බාලසූරිය - නිරීක්ෂක අධිකරණ අමාත්‍යාංශය

[2] 2023 මාර්තු මස සිට දෙසැම්බර් මස දක්වා

## 4.3 අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය කාර්යය මණ්ඩලය

| වර්ගය | වැටුප් කේතය | අනුමත කාර්ය මණ්ඩලය | දැනට පවතින කාර්ය මණ්ඩලය | පුරප්පාඩු |
|---|---|---|---|---|
| ***ජ්‍යෙෂ්ඨ මට්ටම*** | | | | |
| අධ්‍යක්ෂ ජනරාල් | HM 2-3 | 1 | 0 | 1 |
| අධ්‍යක්ෂ | HM 1-3 | 6 | 4 | 2 |
| සහකාර අධ්‍යක්ෂ | MM 1-3 | 3 | 3 | 0 |
| කළමනාකරණ මණ්ඩල ලේකම් | MM 1-3 | 1 | 1 | 0 |
| ***තෘතීය මට්ටම*** | | | | |
| නීති නිලධාරී | JM 1-1 | 3 | 1 | 2 |
| අභ්‍යන්තර විගණන නිලධාරී | JM 1-1 | 1 | 0 | 1 |
| විමර්ශන නිලධාරී | MA 4 | 6 | 4 | 2 |
| රැකවරණ නිලධාරී | MA 4 | 10 | 0 | 10 |
| සන්නිවේදන නිලධාරී | MA 4 | 1 | 0 | 1 |
| තොරතුරු නිලධාරී | MA 4 | 1 | 0 | 1 |
| භාෂා පරිවර්තක | MA 4 | 1 | 0 | 1 |
| ***ද්විතීය මට්ටම*** | | | | |
| කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) | MA 1-1 | 09 | 6 | 3 |
| රැකවරණ නිවාස භාරකරු | MA 1-1 | 01 | 0 | 1 |
| ***ප්‍රාථමික මට්ටම*** | | | | |
| රියදුරු | PL 3 | 6 | 6 | 0 |
| කාර්යාල කාර්ය සහායක | PL 1 | 6 | 5 | 1 |
| **එකතුව** | | **56** | **30** | **26** |

-වගුව 01-

## 4.4 අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරියේ
## -සංවිධාන ව්‍යුහය-



# 05.කාර්යය සාධනය

## 5.1 නීති හා නීති බලාත්මක කිරීමේ අංශය

අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා විධිමත් නෛතික රාමුවක් සහ වැඩපිළිවෙළක් හඳුන්වා දීම මගින් අපරාධ යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය සවිබල ගැන්වීම සඳහා පාර්ලිමේන්තුව විසින් ඒකමතිකව සම්මත කරන ලද 2015 අංක 04 දරන අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත යටතේ, අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය පිහිටුවා ඇත. මෙම අධිකාරිය කළමනාකරණ මණ්ඩලයක් විසින් පාලනය කරනු ලබන අතර වර්තමාන කාර්යය මණ්ඩලය 35කි. අපරාධයක වින්දිතයන්ගේ හිමිකම් සහ අයිතිවාසිකම් මෙන්ම සාක්ෂිකරුවන්ගේ හිමිකම් ආරක්ෂා කිරීම සහ සහාය දීම අධිකාරියේ මූලික කාර්යය භාරය වේ. මෙම 2015 අංක 04 දරන අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත යාවත්කාලීන කරමින් 2023 සැප්තැම්බර් මස 15 දින සිට ක්‍රියාත්මක වන පරිදි 2023 අංක 10 නව පනතක් ලෙස අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ ප්‍රමුඛතාවය ඇතිව පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබූ නව පනත බලාත්මක කර ඇත.

2023 අංක 10 දරන අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන්හට සහාය දීමේ හා ආරක්ෂා කිරීමේ පනතෙහි 3,4,5 යන වගන්ති යටතේ දක්වා ඇති අපරාධයක වින්දිතයන්ගේ හා සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් හා හිමිකම් කඩවීම් සම්බන්ධයෙන් ලැබෙන පැමිණිලි විමර්ශනය කිරීම සහ එම පැමිණිලි සම්බන්ධ අදාල නිර්දේශ අදාල ආයතනවලට ඉදිරිපත් කිරීම මෙම අංශයෙන් සිදුකරන ප්‍රධාන කාර්යය වේ.එසේම පනතෙහි III වන කොටසේ අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන්හට එරෙහිව සිදුවන වැරදි සම්බන්ධයෙන් වන පැමිණිලි අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන්හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පොලිස් කොට්ඨාසය වෙත යොමු කර විමර්ශන පවත්වා, වැරදිකරුවන්ට එරෙහිව කටයුතු කිරීම මෙම අංශය මගින් සිදුකෙරේ.මීට අතිරේකව අපරාධයක වින්දිතයන්ට සිදුවන කායික හා මානසික පීඩා, අලාභ හානි ආදිය සඳහා වන්දි ලබා දීම හා ශ්‍රව්‍ය-දෘශ්‍ය සම්බන්ධක මගින් සාක්ෂි ලබා දීම සඳහා අවශ්‍ය කටයුතු සකස් කිරීම ද මෙම අංශය මගින් සිදුකරයි.

2023 ජනවාරි 01 දින සිට දෙසැම්බර් මස 31 දින දක්වා අපරාධයක වින්දිතයන් හා සාක්ෂි කරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය වෙත මහජනතාව හ රාජ්‍ය ආයතන වෙතින් යොමු කරන ලද සමස්ත පැමිණිලි ගණන 435ක් වේ.

### 5.1.1 - 2023 වර්ෂයේ පැමිණිලි ලැබීම - භූගෝලීය ප්‍රදේශ අනුව:

| පළාත | සංඛ්‍යාව |
|---|---|
| බස්නාහිර | 257 |
| දකුණ | 55 |
| මධ්‍යම | 20 |
| උතුර | 7 |
| උතුරු මැද | 17 |
| වයඹ | 21 |
| සබරගමුව | 31 |
| නැගෙනහිර | 17 |
| ඌව | 10 |
| **එකතුව** | **435** |




## 5.1.2 පැමිණිලි වර්ගීකරණය

අධිකාරියට කරනු ලබන පැමිණිලි, අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත අනුව වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම්/හිමිකම් කඩවීම සම්බන්ධයෙන් සහ වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට එරෙහිව වන වැරදි ලෙස, පැමිණිලි[3] ස්වාභාවය අනුව පහත පරිදි වර්ග කරනු ලැබේ.

i. ආරක්ෂාව සඳහා වන ඉල්ලීම්
ii. අයිතිවාසිකම් හා හිමිකම් කඩවීම්
iii. වැරදි විමර්ශනය
iv. සහය ඉල්ලීම්

| ඉල්ලීම් ස්වාභාවය | සංඛ්‍යාව |
|---|---|
| ආරක්ෂාව සඳහා වන ඉල්ලීම් | 189 |
| අයිතිවාසිකම් හා හිමිකම් කඩවීම් | 105 |
| වැරදි විමර්ශනය | 110 |
| සහය ඉල්ලීම් | 48 |
| **එකතුව** | **452** |




**I. අයිතිවාසිකම් සහ හිමිකම් උල්ලංඝනය වීම්**

[3] එක් පැමිණිල්ලක ඉල්ලීම් එකක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ඇතුලත් වේ.

2015 අංක 4 දරණ අපරාධයක වින්දිතයන් සහ සාක්ෂි කරුවන්හට සහය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනතෙහි 3,4 වගන්ති යටතේ වන අයිතිවාසිකම් සහ හිමිකම් කඩවීම සම්බන්ධයෙන් සිදුකරනු ලබන ඉල්ලීම් විමර්ශනය කිරීමයි.

| | |
|---|---|
| 2022 වර්ෂයෙන් ඉදිරියට ගෙන ලද පැමිණිලිගණන | 123 |
| 2023 වර්ෂයේ තුළ දැනට ලැබී ඇති පැමිණිලි ගණන | 105 |
| **එකතුව** | **228** |
| විමර්ශන අවසන් කරන ලද පැමිණිලි ගණන | 58 |
| තවදුරටත් විමර්ශනය වෙමින් පවතින පැමිණිලි ගණන | 170 |

**II. වැරදි විමර්ශනය**

2015 අංක 4 දරණ අපරාධයක වින්දිතයන් සහ සාක්ෂි කරුවන්හට සහය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනතෙහි 8,9 වගන්ති යටතේ වන වරදවල් සම්බන්ධයෙන් ලැබෙන ඉල්ලීම් විමර්ශනය කිරීමයි.

| | |
|---|---|
| 2022 වර්ෂයෙන් ඉදිරියට ගෙන ලද පැමිණිලි ගණන | 97 |
| 2023 වර්ෂයේ තුළ දැනට ලැබී ඇති පැමිණිලි ගණන | 110 |
| එකතුව | **207** |
| අවසන් කරන ලද පැමිණිලි ගණන | 29 |
| වරද විමර්ශනය කරන ලෙස පොලිස් කොට්ඨාසය හා පොලිස් ස්ථාන වෙත යොමු කර ඇති පැමිණිලි ගණන | 178 |

**III. සහාය ලබා ගැනීම සඳහා වන ඉල්ලීම්**

අපරාධයක වින්දිතයකු වීම හේතුවෙන් විදින ලද යම් හානියක් අලාභයක් හෝ පාඩුවක් සඳහා හානිපූර්ණය සහ ප්‍රතිශ්ඨාපනය ඇතුලු සුදුසු සහ සාධාරණ සහනයක් ලබා දීමයි.

| | |
|---|---|
| 2022 වර්ෂයෙන් ඉදිරියට ගෙන ලද පැමිණිලිගණන | 58 |
| 2023 වර්ෂයේ තුළ දැනට ලැබී ඇති පැමිණිලි ගණන | 48 |
| **එකතුව** | **106** |
| සහය ලබා දී අවසන් කරන ලද පැමිණිලි ගණන | 16 |
| VIS ගොනු කිරීම සඳහා අවශ්‍ය කටයුතු සූදානම් කර ඇති පැමිණිලි ගණන | 40 |
| සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධක මඟින් සාක්ෂි ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සූදානම් කර ඇති පැමිණිලි ගණන | 20 |
| තවදුරටත් සහය ලබා දෙමින් පවතින පැමිණිලි ගණන | 30 |

**2023.01.01 – 2023.12.31 දක්වා වින්දිතයන් වෙනුවෙන් ඉල්ලීම් කිරීම සඳහා අධිකරණයන්හි පෙනී සිට ඇති අවස්ථාවන්**

| වර්ෂය | අධිකරණය | වින්දිතයන් වෙනුවෙන් ඉල්ලීම් කිරීම සඳහා අධිකරණයන්හි පෙනී සිට ඇති අවස්ථාවන් |
|---|---|---|
| **2023** | ▪ කොළඹ මහාධිකරණය | 13 |
| | ▪ කොළඹ මහේස්ත්‍රාත් අධිකරණය | 4 |
| | ▪ ගාල්ල මහේස්ත්‍රාත් අධිකරණය | 6 |
| | ▪ හොරණ මහේස්ත්‍රාත් අධිකරණය | 3 |
| | ▪ ගල්ගමුව මහේස්ත්‍රාත් අධිකරණය | 2 |
| | ▪ පානදුර මහේස්ත්‍රාත් අධිකරණය | 1 |
| | ▪ කොටුව මහේස්ත්‍රාත් අධිකරණය | 4 |
| | ▪ හෙට්ටිපොළ මහේස්ත්‍රාත් අධිකරණය | 2 |
| | ▪ ගම්පහ මහාධිකරණය | 2 |
| | ▪ කඩුවෙල මහේස්ත්‍රාත් අධිකරණය | 1 |
| | ▪ මාතලේ මහාධිකරණය | 1 |
| | ▪ කළුතර මහේස්ත්‍රාත් අධිකරණය | 1 |
| එකතුව | | **40** |

**සමකාලීන ශ්‍රව්‍ය - දෘශ්‍ය සම්බන්ධක මඟින් සාක්ෂි ලබා ගැනීම**

2023 ජනවාරි 01 දින සිට දෙසැම්බර් මස 31 දින තෙක් නීති අංශය වෙත සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධක මඟින් සාක්ෂි ලබා ගැනීම සඳහා ලැබී ඇති පැමිණිලි ගණන - 22

| වර්ෂය | අධිකරණය | සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධක මඟින් සාක්ෂි ලබා ගැනීම සඳහා සහභාගී වූ අවස්ථාවන් |
|---|---|---|
| **2023** | ▪ කොළඹ මහාධිකරණය | **6** |
| | ▪ ගල්ගමුව මහේස්ත්‍රාත් අධිකරණය | **2** |
| | ▪ මීගමුව මහාධිකරණය | **3** |
| | ▪ ඇඹිලිපිටිය මහාධිකරණය | **3** |
| එකතුව | | **14** |

මෙම වර්ෂයේ අධිකරණය මගින් සමකාලීන ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධක මඟින් සාක්ෂි ලබා දීම සඳහා යොමු කරන ලද ඉල්ලීම් ප්‍රමාණය ඉහළ යාම විශේෂ කාරණයක් වේ.ඒ අනුව දේශීය වශයෙන් පමණක් නොව විදේශීය රටවල සිට සාක්ෂි ලබා ගැනීමේ කටයුතු මෙම අධිකාරිය විසින් මෙහෙයවීම සිදු වේ.

**2023.01.01 – 2023.12.31** **දක්වා අධිකාරියට එරෙහිව පවරා ඇති නඩු සඳහා අධිකරණයන්හි පෙනී සිට ඇති අවස්ථාවන් ගණන**

| **පෙනී සිටින ලද දිනය** | **නඩු අංකය** | **අධිකරණය** |
|---|---|---|
| 2023.01.09 | SCFR/372/20 | ශ්‍රේෂ්ඨාධිකරණය |
| 2023.02.16 | CA (writ) 430/22 | අභියාචනාධිකරණය |
| 2023.02.24 | CA (writ) 430/22 | අභියාචනාධිකරණය |
| 2023.03.02 | CA (writ) 430/22 | අභියාචනාධිකරණය |
| 2023.03.15 | SCFR/90, 102,228/20 | ශ්‍රේෂ්ඨාධිකරණය |
| 2023.03.24 | CA (writ) 430/22 | අභියාචනාධිකරණය |
| 2023.04.06 | CA (writ) 430/22 | අභියාචනාධිකරණය |
| 2023.11.23 | CA (writ) 305/23 | අභියාචනාධිකරණය |

2023.01.01 – 2023.12.31 දක්වා විවිධ පොලිස් ස්ථාන විසින් උපදෙස් ලබා දෙන ලෙසට කර ඇති ඉල්ලීම් අනුව 2023 අංක 10 පනත යටතේ සිදුකරනු ලබන විමර්ශන සඳහා අදාල පොලිස් ස්ථාන වෙත අධිකාරිය විසින් උපදෙස් ලබා දී ඇති ලිපිගොනු ගණන - **37**

## රැකවරණ අංශය

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට ආරක්ෂාව ලබා දීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම මෙම අංශයෙන් සිදු කරනු ලබයි. ආරක්ෂාව ලබා ගැනීම සම්බන්ධයෙන් පැමිණිල්ලක් හෝ අධිකරණ හෝ කොමිෂන් සභා නියෝගයක් රැකවරණ අංශය වෙත ලැබු පසු අදාල අපරාධයක වින්දිතයාට හෝ සාක්ෂිකරු හට තර්ජනයක් පවතින්නේද යන්න සම්බන්ධයෙන් අපරාධයක වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ සහායක සහ ආරක්ෂක කොට්ඨාසය මගින් තර්ජන තක්සේරු වාර්තා කැඳවා ගැනීමට රැකවරණ අංශය විසින් කටයුතු කරනු ලැබේ. අදාල තර්ජන තක්සේරු වාර්තාවන් අනුව අපරාධයක වින්දිතයා හෝ සාක්ෂිකරුට පවතින තර්ජනයේ ස්වභාවය සහ ප්‍රමාණ සලකා බැලීමෙන් අනතුරුව අවශ්‍ය ආරක්ෂාව ලබා දීමට කටයුතු කරයි. තර්ජන තක්සේරු වාර්තා ලැබෙන තෙක් අදාල අපරාධයක වින්දිතයාට හෝ සාක්ෂිකරුට අන්තර් ආරක්ෂාවක් ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ.

2023 වසරේ ජනවාරි මස 01 වන දින සිට දෙසැම්බර් මස 31 දින දක්වා රැකවරණ අංශය වෙත ලැබී ඇති පැමිණිලි ගණන 189කි.

එම පැමිණිලි සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග පහතින් දැක්වේ.

| වර්ෂය | ඉල්ලීම් සංඛ්‍යාව | විමර්ශනය වෙමින් පවතින සහ අන්තර් ආරක්ෂාවක් ලබා දෙමින් පවතින ඉල්ලීම් | ආරක්ෂාව ලබා දෙමින් පවතින සහ ආරක්ෂාව ලබා දෙන ලද ඉල්ලීම් | අවසන් කරන ලද ඉල්ලීම් සංඛ්‍යාව | නීතිපති උපදෙස් සඳහා යොමු කරන ලද ඉල්ලීම් |
|---|---|---|---|---|---|
| පෙර වර්ෂ වලින් ඉදිරියට ගෙන එන ලද ඉල්ලීම් | 171 | 39 | 100 | 31 | 01 |
| 2023 | 189 | 162 | 18 | 09 | - |
| **එකතුව** | **360** | **201** | **118** | **40** | **01** |

2023.01. 01 වන දින සිට 2023.09.30 වන දින දක්වා ලැබී ඇති නියෝග පහත පරිදි වේ.

| වර්ෂය | අධිකරණ සහ කොමිෂන් සභා නියෝග ගණන | ආරක්ෂාව ලබා දෙමින් පවතින නියෝග | අවසන් කරන ලද නියෝග |
|---|---|---|---|
| පෙර වර්ෂ වලින්ඉදිරියට ගෙනා නියෝග | 38 | 27 | 11 |
| 2023 | 19 | 18 | 01 |
| **එකතුව** | **57** | **45** | **12** |

- 2023.01.01 දින සිට 2023.12.31 දක්වා අධිකරණ කටයුතු සඳහා සහභාගී වීම වෙනුවෙන් අධිකාරියේ ප්‍රවාහන පහසුකම් යටතේ ආරක්ෂාව ලබා දෙන ලද වින්දිතයන් ගණන හතරකි.
- 2023 අංක 10 දරන පනතේ 4(1) වගන්ති ප්‍රකාරව අධිකරණ කටයුතු වලට සහභාගී වීමේදී වැය වන මුදල් ගෙවීම් වෙනුවෙන් 2023 වර්ෂයේදී අධිකරණ නියෝග 02 ක් ලැබී ඇති අතර ඊට අදාලව මුදල් ගෙවීම සඳහා පියවර ගනිමින්

පවතී. එමෙන්ම 2019 වර්ෂයේදී ලැබී ඇති අධිකරණ නියෝගයකට අදාල අපරාධයක වින්දිතයන් වන සාක්ෂිකාරියක් හට 2023 වර්ෂය තුළ දී නඩු වාර 03 කට අදාලව අධිකරණ කටයුතු වලට සහභාගී වීම සඳහා මුදල් ගෙවා ඇත.

- රැකවරණ අංශය විසින් ශ්‍රව්‍ය දෘෂ්‍ය සම්බන්ධක ඔස්සේ සාක්ෂි ලබා ගැනීම් 03 ක් සිදු කරන ලදි.

## ප්‍රතිපත්ති සහ වැඩසටහන් අංශය

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ ජාතික අධිකාරිය විසින් අපරාධයක වින්දිතයන් හා සාක්ෂිකරුවන්ගේ අයිතිවාසිකම් සහ හිමිකම් පිළිබඳව මහජනයා දැනුවත්කිරීමට සහ මේ සම්බන්ධව කටයුතු කරන නොයෙකුත් රාජ්‍ය ආයතන සංවේදීකරණයට ලක් කිරීම අධිකාරියේ වගකීමක් ලෙස පනතෙහි දක්වා ඇත. එබැවින් මෙම 2023 වර්ෂයේ අධිකාරිය විසින් ක්‍රියාත්මක කරන ලද විවිධ වැඩසටහන් පහත පරිදිය.

**I. "අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ සහ සහාය දීමේ" දිනය-මාර්තු 7 සැමරීම සහ සමගාමී කටයුතු සිදු කිරීම**

ලංකාව තුළ දිනෙන් දින ඉහළ යන අපරාධ හේතුවෙන් වින්දිතභාවයට පත්වන කාන්තාවන්, ළමුන් ඇතුළු පුද්ගලයන්ගේ සංඛ්‍යාව සැලකිල්ලට ගෙන අපරාධයක වින්දිතයන්, සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම පිළිබඳ සමාජය දැනුවත් කිරීමේ අරමුණින් මාර්තු 07 දිනයක් ලෙස කැබිනට් මණ්ඩලය විසින් ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව, එය සැමරීම අධිකරණ හා බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ අමාත්‍යය ගරු ආචාර්යය විජයදාස රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් බත්තරමුල්ල පැලවත්ත විද්‍යාවර්ධන මහා විද්‍යාලයේ ප්‍රධාන ශාලාවේදී 2023 මාර්තු 07 සිදු කරන ලදී.




මෙහිදී අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ සහ සහාය දීමේ දිනය නිමිත්තෙන් සමරු මුද්දරය සහ මුල්දින කවරය එළි දැක්වීම තැපැල්පතිතුමා විසින් සිදු කල අතර ඇමති තුමා ඇතුළු සම්භාවනීය අමුත්තන් හට පිළිගන්වන ලදී.




මෙම සැමරීමේ උත්සවය සඳහා අධිකරණ හා බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ රාජ්‍යය අමාත්‍යය ගරු නිතීඥ අනුරාධ ජයරත්න මහතා, අධිකාරියේ සභාපතිතුමා ඇතුලු කළමනාකරණ මන්ඩලයේ සාමජිකයින්, අධ්‍යක්ෂ ජනරාල්තුමා සහ අධ්‍යක්ෂවරු/සහකාර අධ්‍යක්ෂවරු මෙන්ම පොලිස් ආරකෂක කොට්ඨාශයේ ඉහල නිලධාරීන් සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ නියෝජිත මහත්ම මහත්මීන් සහ දෙමව්පියන් හා පාසැල් ළමුන් (100) සහභාගි වුහ.  තවද පනත පිළිබඳව සැකසූ කෙටි චිත්‍රපටිය ප්‍රථම වරට ප්‍රදර්ශනය කිරීම සිදු විය. මෙම වැඩසටහන සඳහා පූර්ණ අනුග්‍රහය එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මගින් දරණ ලද අතර එම පාසැලේ සියලුම සිසුන්ට (350) දිවා ආහාර වේලක් මෙන්ම මෙම වැඩසටහනට සහභාගි වුවන් හට තේ පැන් සංග්‍රහය සඳහාද දායකත්වය සපයන ලදී. මෙම දිනය සැමරීමට සමගාමීව දිනමිණ, තිනකරන්, සහ ඩේලි නිවුස් පුවත්පත් වල එක් පිටුවක් බැගින් මේ සම්බන්ධ දැන්වීම් පළ කරන ලදී. තවද ලියුම් මගින් සියලුම දිස්ත්‍රික්/ප්‍රදේශීය ලේකම්වරු දැනුවත් කිරීම සිදු කල අතර අධිකරණ අමාත්‍යාංශයේ ඇමතිතුමාගේ මාධ්‍ය ඒකකය හරහා මෙම දිනයේ වැදගත්කම සියලුම රූපවාහිනි සහ ගුවන් විදුලි මාධ්‍ය හරහා පුළුල් ප්‍රචාරයක් ලබා දෙන ලදී.
















## දැනුවත් කිරීමේ සහ සංවේදීකරනය කිරීම සදහා වැඩසටහන් පැවැත්වීම

<u>වැඩසටහන I</u>

**නීති ආධාර කොමිසන් සභාවේ නීතිඥ මහත්ම/මහත්මීන් දැනුවත් කිරීම**

2023 මැයි මස 13 වන දින දකුණු පළාතට අනුයුක්තව සේවය කරන නීති ආධාර කොමිසන් සභාවේ නීතිඥ මහත්ම/මහත්මීන් 45 දෙනෙකු දැනුවත් සහ සංවේදීකරනය කිරීම සදහා වැඩසටහනක් ගාල්ල මවුන්ට් රිච් හෝටලයේදී පැවැත්විය. මෙම වැඩසටහන විශේෂයෙන්ම ආර්ථික හැකියාවක් නොමැති වින්දිතයන්/සාක්ෂිකරුවන් සදහා නොමිලේ නීති ආධාර සැපයීම ඉලක්ක කර එම නඩු සදහා ප්‍රමුඛතාවයක් දක්වා ක්‍රියාකරන ලෙස සහ මානුෂියව බලන ලෙස එම නීතිඥ මහත්ම/මහත්මීන් දැනුවත් සහ සංවේදීකරනය කිරීම සිදු කරන ලදී. මෙම වැඩසටහන සදහා අනුග්‍රහය එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මගින් දරණ ලදී.
















<u>වැඩසටහන II</u>

**මධ්‍යම පළාතේ පොලිස් නිලධාරීන් දැනුවත් සහ සංවේදීකරනය කිරීමේ වැඩසටහන් පැවැත්වීම**

2023 ජුලි 8 වන දින මධ්‍යම පළාතේ ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරින් 33 දෙනෙකුගේ සහභාගිත්වයෙන් නුවර ටොපැෂ් හෝටලයේදී 2015 අංක 4 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත පිළිබඳව දැනුවත් සහ සංවේදීකරනය කිරීමේ එක් දින වැඩසටහනක් පැවැත්විය. අධිකාරියේ කළමණාකරණ මන්ඩලය විසින් යෝජනා කරන ලද මෙම වැඩසටහනේ අරමුණ සියලුම ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරින් මෙම පනත ගැන ලබාගත් අවබෝධය මගින් පහල නිලධාරීන් හට නිවරදිව මග පෙන්විය හැකි විම සහ උපදෙස් දීම කල හැකි වීම වේ.





2023 ජුලි 15-16 දෙදින තුල මධ්‍යම පළාතේ පොලිස් ස්ථානවල අපරාධ අංශයේ ස්ථානාධිපතිවරුන් සහ විශේෂ පොලිස් ඒකකයන්හි ස්ථානාධිපතිවරුන් (99) සඳහා දැනුවත් කිරීමේ සහ සංවේදීකරණ වැඩසටහනක් නුවර ඩෙවොන් හොටලයේදී පැවැත්වීය. මෙම වැඩසටහන් දෙකෙහිදීම පැන නැගුන ප්‍රශ්න අතර නඩු කල්යාම පිළිබඳව දීර්ඝ වශයෙන් සාකච්ඡා වුන අතර ඒ සඳහා පිළියම් ලෙස පොලිස් නිලධාරීන් සඳහන් කල කරුණු අතර අධිකරණ වෛද්‍ය නිලධාරින්ගේ වාර්ථා ප්‍රමාදවීම විශේෂයෙන්ම සැලකිල්ල්ට ලක්විය. මෙම වැඩසටහන් සඳහා අනුග්‍රහය එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මගින් දරණ ලදී.








<u>වැඩසටහන III</u>

**කළුතර දිස්ත්‍රික්කයේ දැනුවත්කිරීමේ නියමු ව්‍යාපෘතිය යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම/ක්ශේත්‍ර නිලධාරීන් දැනුවත් කිරීම හා වින්දිතයන් පිළිබද සමීක්ෂණය**

මතුගම, බණ්ඩාරගම, බුලත්සිංහල, පානදුර සහ දොඩන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවලට අනුයුක්ත ග්‍රාම නිලධාරීන් සහ ක්ශේත්‍ර නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ශ්‍රවණාගාරවලදී පිළිවෙලින් මැයි මස 8 වන දින, 29 වන දින, 31 වන, ජූනි 24 වන සහ අගෝස්තු 10 දිනයන්හිදී 120, 115, 110, 122 සහ 110 ග්‍රාම/ක්ශේත්‍ර නිලධාරී මහත්ම මහත්මීන්ගේ සහභාගිත්වයෙන් පැවැත්විය. මෙම වැඩසටහන් වලදී පනත සහ අධිකාරිය පිළිබදව දැනුවත් කිරීම සිදු කරන ලදී.










එලෙසම කළුතර දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්තුමා, සහකාර දිස්ත්‍රික් ලේකම්වරු සහ සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ සහභාගිත්වයෙන් වස්කඩුව සිට්‍රස් හෝටලයේදී පනත පිළිබදව එක්දින වැඩමුලුවක් ජූලි 28 වන දින පැවැත්වූ අතර ඔවුන් දැනුවත් කිරීම මගින් මෙම පනත ක්‍රියාත්මක කිරීමේ පහළ නිලධාරින්ට මගපෙන්වීම එහි මූලික අරමුණ විය. කලුතර දිස්ත්‍රික්කයේ තොරතුරු ලබාගැනීම සඳහා ප්‍රශ්නාවලි දැනුවත් කිරීමේ වැඩසටහන් වලදී ග්‍රාමනිලධාරී මහත්ම මහත්මීන් හට ලබාදීම කරන ලදී.









__වැඩසටහන IV__

**දැනුවත් කිරීමේ වැඩසටහන් හා සමගාමීව පවත්වනු ලබන 2023 වින්දිතයන් පිළිබඳ සමීක්ෂණය - අම්පාර**

අම්පාර දිස්ත්‍රික්කයේ අම්පාර, උහන සහ දමන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ග්‍රාමනිලධාරී මහත්ම මහත්මීන් සහ ක්ශේත්‍ර නිලධාරීන් 110 බැගින් දැනුවත් කිරීමේ වැඩසටහන් එම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශවල ශ්‍රවණාගාරවලදී පිළිවෙලින් සැප්තැම්බර් මස 7 වන දින, 8 වන දින, 9 වන දිනයන්හිදී පැවැත්වීය. දැනුවත් කිරීමේ වැඩසටහන් වලදී වින්දිතයන් පිළිබඳ සමීක්ෂනය කිරීමට අවශය කටයුතු සුදානම් කරන ලදී.
















<u>වැඩසටහන **V**</u>

**අධිකරණ වෛද්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ සහ සංවේදීකරනය කිරීම සඳහා වැඩසටහන**

මෙම වැඩසටහන ලංකාවේ සිටින සියලුම අධිකරණ වෛද්‍ය නිලධාරින්ගේ සහභාගිත්වයෙන් 2023 සැප්තැම්බර් මස 16 වන දින වස්කඩුව Citrus හෝටලයේදී පවත්වන ලදී. මෙහිදී පොලිස් දෙපාර්තුමේන්තුවෙන් මෙන්ම සහ අධිකරණ වෛද්‍ය නිලධාරින්ගෙන්ද වාර්තා ප්‍රමාද වීම පිළිබඳව කතිකාවතක් පැවැත්වූ අතර ඒ සඳහා පලදායි යෝජනා ඉදිරිපත් විය.








<u>වැඩසටහන **VI**</u>

**2023 අංක 10 දරණ නව පනත පිළිබඳව පොලිස් ආරක්ෂක සහ සහායක කොට්ඨාශයේ සහ අධිකාරියේ තාක්ෂණික නිලධාරීන් සඳහා විශේෂ තාක්ෂණික සැසිය**

මෙම වැඩමුළුව 2023 සැප්තැම්බර් මස 4 වන දින BMICH හිදී පොලිස් ආරක්ෂක සහ සහායක කොට්ඨාශයේ සහ අධිකාරියේ තාක්ෂණික නිලධාරින් 45 දෙනෙකුගේ සහභාගිත්වයෙන් පැවැත්වින. මෙහිදී, 2015 අංක 4 දරණ පනත සහ 2023 අංක 10 පනත පිළිබඳව සංසන්දනාත්මක නීතියේ සුවිශේෂීත වෙනස්කම් සම්බන්ධව සාකච්ඡා විනි.






<u>වැඩසටහන **VII**</u>

**දැනුවත් කිරීමේ වැඩසටහන් හා සමගාමීව පවත්වනු ලබන 2023 වින්දිතයන් පිළිබද සමීක්ෂණය- මොණරාගල**

මොණරාගල දිස්ත්‍රික්කයේ බුත්තල, මොණරාගල සහ වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ග්‍රාමනිලධාරී මහත්ම මහත්මීන් සහ ක්ශේත්‍ර නිලධාරීන් 110 බැගින් දැනුවත් කිරීමේ වැඩසටහන් එම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශවල ශ්‍රවණාගාරවලදී පිළිවෙලින් ඔක්තෝම්බර් මස 11 වන දින, 12 වන දින, 13 වන දිනයන්හිදී පැවැත්වීය. දැනුවත් කිරීමේ වැඩසටහන් වලදී න්දිතයන් පිළිබද සමීක්ෂනය කිරීමට අවශය කටයුතු සුදානම් කරන ලදී.






<u>වැඩසටහන **VIII**</u>

**කොළඹ මහ අධිකරණ නීතිඥ සංගමයේ නීතිඥ මහත්ම/මහත්මීන් දැනුවත් කිරීමේ සහ සංවේදීකරනය කිරීම සඳහා වැඩසටහන**

කොළඹ මහ අධිකරණ නීතිඥ සංගමයේ ඉල්ලීම මත නීතිඥ මහත්ම/මහත්මීන් 60 දෙනෙකුගේ සහභාගිත්වයෙන් දැනුවත් කිරීමේ සහ සංවේදීකරනය කිරීමේ වැඩසටහනක් 2023 නොවැම්බර් 04 වන දින Waters’ Edge හෝටලයේදී පවත්වන ලදී. මෙහිදී විශේෂයෙන්ම 2023 අංක 10 නව පනත පිළිබදව පුළුල් කතිකාවතක් ඇතිවිය.









## <u>වැඩසටහන IX</u>

**නීති පද්ධතිය මගින් වින්දිතත්වට පත්වීම වැලැක්වීම සහ අපරාධ අඩුකිරීම පිළිබඳව පසැල් ළමුන් දැනුවත් කිරීමේ විශේෂ වැඩසටහන - වේල්ස් කුමර විදුහල, මොරටුව**

මේ වැඩසටහන මොරටුවේ වේල්ස් කුමර විදුහලේ ළමුන් 120 දෙනෙකුගේ සහභාගිවයෙන් 2023 නොවැම්බර් 04 වන දින එම විදුහලේ සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වන ලදී. මෙම ළමුන් විදුහලේ ශිෂ්‍ය නායකයින් මෙන්ම නායක්ත්වයක් උසුලන ගුරු මහත්ම මහත්මීන්ගේ  අනුදැනුම මත උපදේශනාත්මක සේවාවන් සපයන කණ්ඩායමක් වීම පාසල තුල සහ පිටත අපරාධ වලින් වින්දිතත්වට පත්වීම අඩුකිරීම සඳහා දායකත්වයක් දක්වනු ඇත.














<u>වැඩසටහන **X**</u>

**ඇඹිලිපිටිය නීතිඥ සංගමයේ නීතිඥ මහත්ම/මහත්මීන් දැනුවත් කිරීමේ සහ සංවේදීකරනය කිරීම සඳහා වැඩසටහන**

ඇඹිලිපිටිය නීතිඥ සංගමයේ  ඉල්ලීම මත නීතිඥ මහත්ම/මහත්මීන් 50 දෙනෙකුගේ සහභාගිත්වයෙන් දැනුවත් කිරීමේ සහ සංවේදීකරනය කිරීමේ වැඩසටහනක් 2023 දෙසැම්බර් 09 වන දින ඇඹිලිපිටියේ Centuria හෝටලයේදී පවත්වන ලදී. මෙහිදී විශේෂයෙන්ම 2023 අංක 10 නව පනත පිළිබදව ඔවුන් දැනුවත් කරන ලදී.














<u>වැඩසටහන **XI**</u>

**නීති පද්ධතිය මගින් වින්දිතත්වට පත්වීම වැලැක්වීම සහ අපරාධ අඩුකිරීම පිළිබඳව පසැල් ළමුන් දැනුවත් කිරීමේ විශේෂ වැඩසටහන - වේල්ස් කුමරි විදුහල, මොරටුව**

මේ වැඩසටහන මොරටුවේ වේල්ස් කුමරි විදුහලේ ළමුන් 120 දෙනෙකුගේ සහභාගිවයෙන් 2023 දෙසැම්බර් 22 වන දින එම විදුහලේ ප්‍රධාන ශාලාවේදී පවත්වන ලදී. මෙම ළමුන් විදුහලේ ශිෂ්‍ය නායකයින් මෙන්ම නායකත්වයක් උසුලන කණ්ඩායමක් වීම පාසල තුල සහ පිටත අපරාධ වලින් වින්දිතත්වට පත්විම අඩුකිරීම සඳහා දායකත්වයක් දක්වනු ඇත.










## II. Pull-up බැනර් සැකසීම සහ ආයතන පරිශ්‍රවල ප්‍රදර්ශනය

අධිකාරියේ කාර්යයභාරය ඉතාමත්ම සැකෙවින් සහ මහජනතාවට තේරුම් යන ආකාරයට 2022 ප්‍රතිපාදන වලින් සකසන ලද pull-up බැනර් පහත සඳහන් ආයතන පරිශ්‍රවල මහජනයා ගැවසෙන ස්ථාන වල 2023 වර්ෂයේදී ප්‍රදර්ශනය කර ලදී. මෙය අධිකාරිය පිළිබඳව මහජනයා දැනුවත් කිරීමේ ක්‍රියාදාමයේ එක් අංගයකි.

1. අධිකරණ , බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
2. අධිකරණ වෛද්‍ය හා විෂ විද්‍යාව පිළිබඳ ආයතනය
3. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
4. රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
5. ආගමන හා විගමන දෙපාර්තමේන්තුව
6. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව
7. ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
8. ජාතික අධිකරියේ පරිශ්‍රයේ
9. කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
10. ඉසුරුපාය අධ්‍යාපන අමාත්‍යාංශය

III. අධිකාරියේ කාර්යභාරය පිළිබඳව මහජනතාව දැනුවත්කිරීමේ අරමුණින් අධිකරණ අමාත්‍යාංශයේ ඇමතිතුමාගේ මාධ්‍ය ඒකකය හරහා සියලු මාධ්‍ය දැනුවත් කිරීම මාර්තු මස 2 වන දින සිදු කරන ලදී. මේ සඳහා අධිකාරියේ සභාපතිතුමා, අධ්‍යක්ෂ ජනරාල්තුමා සහ අධ්‍යක්ෂ- නීති සහ අධ්‍යක්ෂ-ප්‍රතිපත්ති හා වැඩසටහන් මහත්ම මහත්මීන් සහභාගී වූහ.

IV. මාර්තු 7 වන දින හරිත TV ඔස්සේ නීති අධ්‍යක්ෂතුමිය විසින් අධිකාරියේ කාර්යභාරය පිළිබඳව මහජනතාව දැනුවත්කිරීමේ වැඩසටහනක් සඳහා දායකත්වය ලබා දුනි.

V. අන්තර්ජාතික කාන්තා දිනය නිමිත්තෙන් කාන්තා පොලිස් නිලධාරින්ගේ සහභාගිත්වයෙන් මාර්තු 8 වන දින කොළඹ නියෝජ්‍ය පොලිස්පති කාර්යාලයේ ශ්‍රවනාගාරයේ පොලිස් කොමිසම් සභාව විසින් සංවිධානය කරන ලද “කාන්තා වින්දිතයින් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම” සම්බන්ධ වැඩසටහනකට දායකත්වය ලබා දුනි.

VI. අන්තර්ජාතික කාන්තා දිනය නිමිත්තෙන් මාර්තු 8 වන දින ITN නාලිකාවේ කරන ලද සම්මුඛ සාකච්ඡාවේදී හිංසනයට පත් කාන්තාවන්ට අධිකාරියෙන් ලබාගත හැකි සේවය පිළිබඳව මහජනතාව දැනුවත්කිරීම කළමණාකරන මණ්ඩල ලේකම්තුමිය විසින් පැහැදිළි කරන ලදී.

VII. ජාතික පොලිස් කොමිසන් සභාවේ ප්‍රධාන පොලිස් පරීක්ෂකවරුන් 450 සඳහා මැයි මස 29, 30 සහ 31 දිනයන් තුල පනත පිළිබඳව අධිකාරියේ කලමණාකරන ලේකම්තුමිය විසින් පනත පිළිබඳව දේශන (online) පවත්වන ලදී.

VIII. මැයි මස 17 වන දින පොලිස් සේවාස්ථ පුහුණු ආයතනයේදී පොලිස් නිලධාරින් 40 දෙනෙකු සඳහා පනත පිළිබඳව අධිකාරියේ කලමණාකරන ලේකම්තුමිය විසින් දේශනයක් පවත්වන ලදී.

IX. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නීති සහ පොලිස් නිලධාරීන් සඳහා සැප්තැම්බර් මස 02 වන දින පනත පිළිබඳව අධිකාරියේ කලමණාකරන ලේකම්තුමිය විසින් පනත පිළිබඳව දේශනයක් පවත්වන ලදී.

X. 2023 ජූලි මසදී වින්දිතයන්හට සහය සපයන අන්තර්ජාතික ආයතනයක් වන Victim Support Asia (VSA) හා එක්වී ඔවුන්ගේ තරගකාරී වැඩසටහන සමග සම්බන්ධ වී අධිකාරියෙන් සහය අපේක්ෂා කරන ලද වින්දිතයන් දෙදෙනකු හට US$1000 (Rs 300,000.00 පමණ) බැගින් එම වින්දිතයන්ගේ වින්දිතභාවය නිසා වූ හානිය අවම කරගැනීමට ආධාර ලබා දෙන ලදී.

XI. අධිකාරියේ 2022 වාර්ෂික වාර්තාව භාෂා තුනෙන්ම පිලියෙළ කර කැබිනට් මණ්ඩලයේ අනුමැතියට ඉදිරිපත් කරන ලදී.

XII. අධිකාරියේ 2023 අය වැය විවාදය සඳහා ප්‍රගති වාර්තාව භාෂා තුනෙන්ම පිලියෙළ කර අධිකරණ අමාත්‍යාංශය හරහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.

XIII. අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරිමේ 2023 අංක 10 නව පනත පිළිබඳව දැනුවත් කිරීමේ සහ 2015 අංක 4 දරණ පනත සමග සංසන්දනාත්මක වෙනස්කම් සාකච්ඡාව 2023 ඔක්තෝම්බර් 04 වන දින BMICH ආයතනයේදී අධිකාරියේ ඉහල නිලධාරින්ගේ සහ පොලිස් ආරක්ෂක කොට්ඨාශයේ නිලධාරින්ගේ සහභාගිත්වෙන් පැවැත්විය.

XIV. අධිකාරිය නියෝජනය කරමින් තැනැත්තන් වෙළදාම සම්බන්ධව ජාතික කාර්යය සාධන බලකාය සඳහා කලමණාකරන ලේකම්තුමිය විසින් අගෝස්තු මස 16 වන දින සහ දෙසැම්බර් මස 06 වන දින ප්‍රාදේශීය ලේකම්වරුන් සඳහා පනත පිළිබඳව දේශන පවත්වන ලදී.

XV. ආරක්ෂක අමාත්‍යාංශය හා Safe Foundation ආයතනය සමග එක්ව ළමා හිමිකම් සහ විදේශ සේවා සංවර්ධන නිලධාරින් හට සැප්තැම්බර් මස 20 වන දින කරන ලද වැඩසටහන සඳහා අධිකාරියේ කලමණාකරන ලේකම්තුමිය විසින් දේශනයක් පවත්වන ලදී.

XVI. Transparency International ආයතනය සංවිධානය කරන ලද පුද්ගලයෙකු විශේෂඥයකුට යොමු කිරීම උපදෙස් සඳහා ක්‍රමය පිළිබඳව වට මේස සාකච්ඡාව සඳහා සැප්තැම්බර් මස 20 වන දින කලමණාකරන ලේකම්තුමිය විසින් දේශනයක් පවත්වන ලදී.

# පාලන හා කළමනාකරණ අංශය

### දේශීය / විදේශීය පුහුණු

අදාළ කාලය තුළ දේශීය හෝ විදේශීය පුහුණු වැඩසටහන් සඳහා කාර්යමණ්ඩලය යොමු නොකරන ලදී. (ප්‍රතිපාදන ලැබී නොමැත)

### ප්‍රසම්පාදන

| අනු අංක | විස්තරය / ප්‍රසම්පාදනයන් පිළිබඳ විස්තර | වැය කරන ලද මුදල රු. | මුදල් වෙන් කරන ලද ආකාරය |
|---|---|---|---|
| 01 | රැකවරණ නිවස වටා ආරක්ෂිත යකඩ වැටක් ඉදිරි කිරීම | 965,000.00 | එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) |
| 02 | අභ්‍යන්තර විගණන නිලධාරී සඳහා කාර්යාල කාමරයක් සකස් කිරීම | 222,000.00 | ප්‍රාග්ධන (GOSL) |
| 03 | රැස්වීම් ශාලාව සඳහා පුටු 10 ක් මිළ දී ගැනීම | 404,990.00 (බදු සහිත) | ප්‍රාග්ධන (GOSL) |
| 04 | ප්‍රධාන කාර්යාලය සඳහා Water Filter එකක් මිළ දී ගැනීම විදුලිපංකාවක් මිළ දී ගැනීම | 52,860.00<br>14,720.00 | ප්‍රාග්ධන (GOSL) |

### මානව සම්පත් කළමනාරණය

01. මෙම අධිකාරියේ අනුමත කාර්යය මණ්ඩලය 56ක් වන අතර දැනට සේවයේ යෙදී සිටින සංඛ්‍යාව 30කි. අධිකාරියේ සමස්ත පුරප්පාඩු සංඛ්‍යාව 26කි. ඒ අනුව ආයතනයට අත්‍යවශ්‍ය තනතුරු පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට අමාත්‍ය මණ්ඩල අනුකමිටුව මගින් පහත පරිදි නිලධාරීන් බඳවා ගැනීමට අනුමැතිය ලැබිණි.

| අනු අංක | තනතුර | වැටුප් කේතය | ඉල්ලුම් කළ සංඛ්‍යාව | කමිටුව විසින් නිර්දේශිත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01 | අධ්‍යක්ෂ (රැකවරණ) | HM 1-3 | 01 | 01 |
| 02 | නීති නිලධාරී | JM 1-1 | 02 | 02 |
| 03 | රැකවරණ නිලධාරී | MA 4 | 03 | 03 |
| 04 | විමර්ශන නිලධාරී | MA 4 | 01 | 01 |

02. අභ්‍යන්තර විගණන නිලධාරියකු වැඩ බැලීමේ පදනම මත බඳවා ගන්නා ලදී.

| තනතුර | තනතුරු ගණන | වර්තමාන තත්වය |
|---|---|---|
| අධ්‍යක්ෂ ( රැකවරණ) | 01 | අයදුම්පත් කැඳවූ අතර සුදුසුකම් ලත් එක් අයදුම් පතක් වත් නොවීය. |
| නීති නිලධාරී | 02 | බඳවා ගැනීම් අවසන් |
| විමර්ශන නිලධාරී | 01 | සම්මුඛ පරීක්ෂණ අවසන් |
| රැකවරණ නිලධාරී | 03 | 2024.01.03 දින සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට නියමිතව ඇත. |
| රැකවරණ නිවාස භාරකරු | 01 | බඳවා ගැනීම් අවසන් |

- පසුගිය වසර දෙක සහ මේ වසරේ අලුතින් අනුමත කරන ලද තනතුරු

| වර්ෂය | තනතුර | තනතුරු ගණන | වෙනත් තොතුරු |
|---|---|---|---|
| 2021 | - | - | - |
| 2022 | රැකවරණ නිවාස භාරකරු | 01 | කළමනාකරණ සහකාර තනතුරක් යටපත් කර මෙම තනතුර අනුමත කරවා ගන්නා ලදී. |
| 2023 | - | - | - |

- **කළමනාකරණ මණ්ඩල සහ අනෙකුත් රැස්වීම්**

කළමනාකරණ මණ්ඩල රැස්වීම් - 13

විගනණ හා කළමනාකරණ මණ්ඩල රැස්වීම - 02

ලේකම් තුමන්/තුමිය සමග රැස්වීම් - 01

ජ්‍යෙෂ්ඨ කළමනාකරණ නිලධාරීන්ගේ රැස්වීම් - 05

# මූල්‍ය ප්‍රගතිය

පනත ප්‍රකාරව අධිකාරියේ ආරක්ෂණ අරමුදල ස්ථාපිත කර ඇති අතර 2023.12.31 දින වන විට එය රු. මිලියන **28.78** ක් දක්වා වර්ධනය වී ඇත.

## 2023.01.01 සිට 2023.12.31 මූල්‍ය ප්‍රගතිය- රජයේ ප්‍රතිපාදන

| විස්තරය | 2023 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මි) | සංශෝධිත ප්‍රතිපාදන 2023 (රු.මි) | නිදහස් කරන ලද ප්‍රතිපාදන (රු.මි) | 2023.12.31 දිනට වියදම (රු.මි) | 2023.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය නිදහස් කරන ලද ප්‍රතිපාදන වලින් (%) | 2022.12.31දිනට මූල්‍ය ප්‍රගතිය වෙන් කරන ලද ප්‍රතිපාදන වලින් (%) |
|---|---|---|---|---|---|---|
| පුනරාවර්තන වියදම | 50.00 | 49.16 | 45.58 | 44.42 | 100 % | 98 % |
| ප්‍රාග්ධන වියදම | 6.00 | 6.00 | 1.5 | 1.22 | 92.5% | 81% |
| **එකතුව** | **56.00** | **55.16** | **47.08** | **45.64** | **97%** | **83%** |

2023.01.01 සිට 2023.12.31 මූල්‍ය ප්‍රගතිය- UNDP ප්‍රතිපාදන

| විස්තරය | 2023 වර්ෂය සඳහා ප්‍රතිපාදන (1 වාරිකය - 2023) (රු.මි) | නිදහස් කරන ලද ප්‍රතිපාදන (රු.මි) | 2023.12.31 දිනට වියදම (රු.මි) | 2023.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය නිදහස් කරන ලද ප්‍රතිපාදන වලින් (%) |
|---|---|---|---|---|
| ප්‍රාග්ධන වියදම | 12.83 | 12.83 | 10.12 | 79% |
| **එකතුව** | **12.83** | **12.83** | **10.12** | **79%** |

# 06. මූල්‍ය ප්‍රකාශනය හා විගණන වාර්තාව

National Audit Sub Office
2 2 FEB 2024
JLO/F Branch

# FINAL ACCOUNTS 2023

## THE NATIONAL AUTHORITY FOR THE PROTECTION OF VICTIMS OF CRIME AND WITNESSES

MINISTRY OF JUSTCIE, HUMAN RIGHTS AND LEGAL REFORMS

1ST FLOOR, 428/11A, DENZIL KOBBEKADUWA MAWATHA, BATTARAMULLA

# Content

| Content | Page Number |
|---|---|
| Accounting Policies | 01-05 |
| Statement of Financial Position | 06-06 |
| Statement of Financial Performance | 07-07 |
| Cash Flow Statement | 08-08 |
| Statement of Changes of Equity | 09-09 |
| Notes to the Financial Performance | 10-11 |
| Notes to the Financial Position | 12-15 |
| Investment Schedule | 16-16 |
| Income & Expenditure Statement for Authority Protection Fund | 17-17 |
| Statement of Financial Position for Authority Protection Fund | 18-18 |
| Expenditure Report For United Nations Development Programme | 19-19 |

## NOTES TO THE FINANCIAL STATEMENTS FOR THE YEAR ENDED 31.12.2023

ACCOUNTING POLICIES

1. CORPORATE INFORMATION

### 1.1. Domicile and Legal Form

National Authority for the Protection of Victims of Crime & Witnesses established by Assistance to and Protection of Victims of Crime & Witnesses Act No. 10 of the year 2023 by the parliament of Democratic Socialist Republic of Sri Lanka and expanding its area of services further, under the Ministry of Justice. The head office is located at No. 428/11 A, Denzil Kobbekaduwa Mawatha, Battaramulla, Sri Lanka.

### 1.2 Principal Activities and Nature of Operations

With the aspect of achieving the objects of the Act, the duties and the functions of the Authority are enlisted under Section 40 of Assistance to and Protection of Victims of Crime & Witnesses Act No. 10 of 2023.

### 1.3 The Number of Employees

The number of employees at the end of the year 2023 was 34.

2 BASIS OF PREPARATION

### 2.1 Statement of Compliance.

The financial statements of National Authority for the Protection of Victims of Crime & Witnesses comprise the Statement of Financial Position, Statement of Financial Performance, Statement of Cash Flow, Statement of Changes in Equity and Notes to the Financial Statements and other explanatory information. These statements are prepared in accordance with the Sri Lanka Public Sector Accounting Standards (SLPSAs) laid down by the Institute of Chartered Accountants of Sri Lanka (ICASL).

### 2.2. Basis of Measurement

The financial Statements have been prepared on the historical cost Basis.

No adjustments have been made for inflationary factors in the financial statements

### 2.2 Functional and presentation Currency.

These financial Statements are presented in Sri Lankan Rupees, which is the National Authority for the Protection of Victims of Crime & Witnesses functional currency.

## 3 SIGNIFICANT ACCOUNTING POLICIES

These accounting policies set out bellow have been applied consistently to all periods presented in these financial statements.

### 3.1. Property, Plant and Equipment

The cost of Property, Plant and Equipment is the cost of acquisition or construction together with any expenses incurred in bringing the asset to its working condition for its intended use. Subsequent to the initial recognition as an asset at cost, revalued assets are carried at revalued amount less any subsequent deprecation thereon. All other Property, Plant and Equipment are stated at cost less accumulated depreciation. Where an item of Property, plant and equipments comprises major components having different useful lives, they are accounted for as separate item of Property, plant and equipments.

The asset's residual values, useful lives and methods of depreciation are reviewed, and adjusted if appropriate, at each financial year end.

### Property, Plant and Equipment- Received as Grant

Property, Plant and Equipment acquired under any grant are capitalized at cost.

Property, Plant and Equipment other than freehold land are stated at cost less accumulated depreciation. Free hold land is stated at cost.

Depreciation is charged on all Property, Plant and Equipment other than freehold land to write off the cost over the estimated useful lives.

Depreciation has been provided for the year on pro-rata basis.

Property, Plant and Equipment are depreciated on straight line method as mentioned below, further, that the all Property, Plant and Equipment have been accounted at cost method as prescribe in the **SLPSAS 7 - Property, Plant & Equipment**.

| | | |
|---|---|---|
| 1. | Building | 4% |
| 2. | Motor Vehicle | 12.5% |
| 3. | Computer & Accessories | 25% |
| 4. | Furniture & Office Equipment | 10% |
| 5. | Office Premises | 4% |
| 6. | Soft Ware | 25% |
| 7. | Others | 10%. |

An item of Property, Plant and Equipment is derecognized upon disposal or when no future economic benefit is expected from its use or disposal. Any gain or loss arising on de-recognition of the asset (Calculated as the difference between the net disposal proceeds and the carrying amount of the asset) is included in the income statement in the year the asset is derecognized.
Expenditure incurred on repairs or maintenance of Property, Plant and Equipment in order to restore or maintain future economic benefit expected from originally assessed standard of performance is recognized as an expense when incurred.

### 3.2 Inventories

The inventories used during the financial year had, been charged to the income & expenditure statement at cost.

Balance stock has been valued at cost, selling price or net realizable value whichever is lower.

### 3.3. Cash and Cash equivalents

Cash and cash equivalents comprise cash in hand and held at bank.

### 3.4. Cash flow Statement

Cash flow Statement has been prepared using the indirect method.

### 3.5. Liabilities and Provisions

Liabilities are recognized in the balance sheet when there is a present obligation as a result of past events, the settlement of which is expected to result in an outflow of resources embodying economic benefits. Obligations payable at the demand of the creditors or within one year of the balance sheet date are treated as current liabilities in the Balance sheet.

Provision is recognized if, as a result of a past event, the National Authority for the Protection of Victims & Crime Witnesses has a present legal or constructive obligation that can be estimated reliably, and it is probable that an outflow of economic benefit will be required to settle the obligation.

### 3.6. Taxation

Tax expenses reported in the financial statement and computed in accordance with the provision of the Inland Revenue Act, No. 24 of 2017 and its amendments thereto.

### 3.7. Employee Benefits

I. Define Contribution Plan.

Obligation to define contribution plan are recognized as an expense in the income statement as incurred. National Authority for the Protection of Victims of Crime & Witnesses contributes 12% and 3% of gross emoluments of employees to Provident Fund and Trust Fund respectively.

### II. Define Benefit Plan

Gratuity is a define benefit plan. National Authority for the Protection of Victims of Crime & Witnesses is liable to pay gratuity in terms of the relevant statute. In order to meet this liability, a provision is carried forward in the balance sheet, equivalent to an amount calculated based on a half month's salary of the last of the financial year of all employees for each completed year of service, commencing from the first year of service.

Provision is made for retirement gratuity for all employees in respect of gratuity payable under the payment of gratuity Act No. 12 of 1983. This item is grouped under non current liabilities in the balance sheet.

According to The Treasury, a fund is not necessary, as they will grant the funds when required.

### 3.8. Funds of the Authority

As per Section 90 and Section 91 of the Act, the Authority has two (2) Funds.

1. Fund of the Authority

   This fund should be credited
   -all such money as may be voted from time to time by Parliament for the use of the authority and
   -all such sums of money as may be received by the authority by way of donations, gifts, bequests, and grants from sources within or outside Sri Lanka.

   Expenditure incurred by the Authority in the exercise and performance of its duties and functions under the Act, shall be paid out of Fund of the authority.

2. Protection Fund

   There shall be paid into the Protection Fund
   -all such sums as may be voted by the parliament for such fund;
   -all such sums as may be received by the Authority to be remitted to the Protection Fund by the way of any gift, donation, contribution, bequest and grant from any local or foreign sources and
   -all such monies remitted by the Court under subsection (1) (2) section 65.

   There shall be paid out of the Protection Fund as may be determined by the Board for the payments under subsection (4)(a), (b) and (c) of section 91.

### 3.9. Revenue Recognition

### 3.9.1 Revenue Recognition

All such monies remitted by a Court under subsection (1), (2) of section 65 are accounted on receipt basis whilst interest and all other income are accounted on accrual basis.

#### 3.9.2 Expenditure

All expenditure incurred in the running of the board has been accounted on accrual basis and all expenditure incurred in the acquisition, extension or improvement of assets of a permanent nature in order to carry on or increase the earning capacity of the Board has been treated as capital expenditure.

### 3.10. Comparative information

Where necessary, comparative figures have been rearranged to conform to the current year presentation.

### 3.11. Events occurring after balance sheet date

All material post balance sheet events have been considered and where appropriate adjustment or disclosures have been made in respective note to the financial statement.

### 3.12. Commitments and contingencies

Contingencies are possible assets or obligations that arise from a past event and would be confirmed only on the occurrence or non-occurrence of uncertain future events, which are beyond the Board's control.

### 3.13. Accounting of Grants

i. Government Grants

